**වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදල - 2022**

**---------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් ''මනාලෙස සැලසුම් කරන ලද'' අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ අංක 04 මාර්ගෝපදේශය ප්‍රකාරව ව්‍යවස්ථාපිත අරමුදල්වල ගනුදෙනු විධිමත් මූලාශ්‍ර ලේඛන ආශ්‍රයෙන් මූලික පොත්වල හා ලෙජර් ගිණුම්වල සටහන් කර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් පිළිබඳ ප්‍රකාශය හා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. එසේ වුවද, අරමුදල සඳහා ලෙජර් ගිණුම් පවත්වා නොතිබුණු අතර මුදල් පදනම අනුගමනය කරමින් ආදායම් හා වියදම් වර්ගීකරණය නොකර මුදල් පොතේ සියලුම ලැබීම් හා ගෙවීම් එකින් එක ඇතුළත් කරමින් ආදායම් හා වියදම් ගිණුමක් සකස් කර ඉදිරිපත් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන්නන්ට නිසි ආකාරයට තොරතුරු ලබාගැනීමට අරමුදල සඳහා ලෙජර් ගිණුම් පවත්වා ගැනීම ඉදිරියේදී ආරම්භ කරන බව දන්වා සිටිමි. | විධිමත් මූලාශ්‍ර ලේඛන ආශ්‍රයෙන් ගනුදෙනු මූලික පොත්වල හා ලෙජර් ගිණුම්වල සටහන් කර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකරණය මඟින් අයකර එවනු ලබන දඩ මුදල්වලින් පරිපාලන වියදම් සඳහා සියයට 5 ක මුදලින් අරමුදලේ කටයුතු වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් දරන ලද යටිතල පහසුකම්, ලිපි ද්‍රව්‍ය හා අනෙකුත් වියදම් පියවා ගැනීමට කටයුතු නොකර රු.482,015ක් දෙපාර්තමේන්තු පොදු තැන්පතු ගිණුමෙහි රඳවාගෙන තිබුණි. | පරිපාලන වියදම් සඳහා වෙන් කරන ලද රු.482,015 ක් කාර්යාල උපකරණ හා ලිපිද්‍රව්‍ය ලබාගැනීමට මේ වන විට කටයුතු කරමින් පවතින බව දන්වා සිටිමි. | අරමුදලේ කටයුතු වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් දරනු ලබන පොදු කාර්ය වියදම් පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2022 දෙසැම්බර් 31 දින වන විට පොලිස් ස්ථාන 30 කට අදාළව මහේස්ත්‍රාත් අධිකරණ විසින් අයකරගෙන තිබුණු රු.11,656,250 ක දඩ මුදල අරමුදල වෙත ලබා ගැනීමට 2023 අප්‍රේල් 10 විගණිත දින දක්වාම නොහැකි වී තිබුණු අතර ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කිරීමට ද කටයුතු කර නොතිබුණි. මහේස්ත්‍රාත් අධිකරණ හා පොලිස් ස්ථාන අතර මනා සම්බන්ධීකරණයක් නොතිබීම ඊට හේතු වී තිබුණි. | පොලිස් ස්ථානවලින් ත්‍යාග ලබාගැනීම සඳහා වාර්තා එවා තිබුණ ද අදාළ මහේස්ත්‍රාත් අධිකරණ මඟින් එම මුදල් එවා නොමැති හෙයින් ඒ සඳහා ලිපි යොමු කර ඇත. පොලිස් ස්ථාන මඟින් නාමලේඛන එවීමේ දී පොලිස් නිලධාරීන්ගේ නම්වල මුලකුරු නොමැති වීමෙන් ද, කොටස් වශයෙන් ලැබෙන දඩ මුදල් සම්පූර්ණයෙන් ම ලැබෙන තෙක් ද ත්‍යාග ලබා දීමට නොහැකි වී ඇත. | මහේස්ත්‍රාත් අධිකරණ හා පොලිස් ස්ථාන අතර මනා සම්බන්ධීකරණයක් ඇතිව අදාළ මුදල් සම්පූර්ණයෙන් හා කඩිනමින් ලබාගෙන ත්‍යාග ලබා දීමට කටයුතු කළ යුතු අතර ගෙවිය යුතු මුදල මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 31 (ඊ) වගන්තිය අනුව පිහිටුවන ලද වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදලින් ත්‍යාග ගෙවීම් කිරීමේ මාර්ගෝපදේශ හා උපමානයන්හි 1 වන මාර්ගෝපදේශය | මෙම ත්‍යාග අරමුදල වෙත 2014 සිට 2022 වර්ෂය දක්වා බැර කරන ලද රු.13,214,810 ක දඩ මුදලින් ත්‍යාග සඳහා ගෙවිය යුතු මුදල රු.6,607,405 ක් වුවද, එයින් රු.3,232,155ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි. | මහේස්ත්‍රාත් අධිකරණ මඟින් කොටස් වශයෙන් ගෙවන ලෙස චූදිතයින්ට නියම කර ඇති දඩ මුදල් සම්පූර්ණ වශයෙන් අරමුදලට බැර වනතුරු අදාළ ගෙවීම් සිදුකළ නොහැකි අතර, පොලිස් නිලධාරීන්ගේ නාම ලේඛන ද ලැබී තිබිය යුතුය. | අධිකරණය මඟින් අදාළ දඩ මුදල් හා පොලිස් නිලධාරීන්ගේ නාම ලේඛන නිසි ලෙස ලබාගෙන ත්‍යාග මුදල් ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 2020/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ | | | |
| (i) | 15(1)(ඇ) හා (ඈ) ඡේද | අරමුදල සඳහා චක්‍රලේඛ ප්‍රකාරව අයවැය ලේඛනයක් සකස් කර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | 2023 වර්ෂයේ අයවැය ලේඛනයක් පිළියෙල කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති බව. | අනුමත අයවැය ලේඛනයකට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 3(2) (ඈ) හා (ඊ) ඡේද | ගිණුම් වර්ෂය අවසන් වී මාස 2ක් අතුළත අරමුදල පිළිබඳ කාර්යසාධන වාර්තාවක් සකස් කර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපතිවරයා යොමුකිරීමටත්, වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමටත් ආරම්භයේ සිටම කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව වාර්ෂික කාර්යසාධන වාර්තාවක් පිළියෙළ කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමටත් එය පාර්ලිමේන්තුවේ සභාගත කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකරණ විසින් වරදකරුවන්ගෙන් අයකරගනු ලබන සියළුම දඩ මුදල්, අරමුදල වෙත අයකර ගැනීම සඳහාත්, එසේ අයකර ගන්නා මුදල් අදාළ පාර්ශව වෙත ත්‍යාග වශයෙන් ලබාදීම සඳහාත් මහේස්ත්‍රාත් අධිකරණ හා පොලිස් දෙපාර්තමේන්තුව සමඟ තොරතුරු හුවමාරු කිරීමේ නිසි ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. ඒ හේතුවෙන් අධිකරණවලින් ලැබිය යුතු දඩ මුදල් සහ ත්‍යාග ලබා දිය යුතු පුද්ගලයින් පහසුවෙන් හා ඉක්මණින් හඳුනාගෙන අදාළ තොරතුරු ලබාගැනීමට නොහැකි වී ඇති අතර භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතු සියයට 40 ක දඩ මුදල් ප්‍රමාණය ද නිසි වේලාවට ප්‍රේෂණය කිරීමට නොහැකි වී තිබුණි. | වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ පනත යටතේ නඩු පැවරීම පොලිසිය විසින් සිදුකරනු ලබන බැවින් ත්‍යාග ලබාදිය යුතු පුද්ගලයින්ගේ නාමලේඛන අදාළ පොලිස් ස්ථානාධිපති විසින් එවිය යුතුය. දඩ මුදල් අධිකරණය මඟින් මෙම දෙපාර්තමේන්තුව වෙත යොමුකරනු ලැබුව ද, අදාළ පොලිස් ස්ථාන පිළිබඳව වාර්තා නොවන බැවින් ඒ පිළිබඳව වෙනම විමසා බලා ත්‍යාග ලබාදෙනු ලබයි.<br>අධිකරණ අමාත්‍යාංශය මඟින් සියලුම මහේස්ත්‍රාත්වරුන් වෙත දඩ මුදල් එවීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. | මහේස්ත්‍රාත් අධිකරණ හා පොලිස් දෙපාර්තමේන්තුව සමඟ තොරතුරු හුවමාරු කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කරගෙන ත්‍යාග මුදල් හා භාණ්ඩාගාරයට ගෙවිය යුතු මුදල් නිසි වේලාවට ගෙවීමට කටයුතු කළ යුතුය. |